මස්ජිද්වල මිනිසුන් එකිනෙකා අලංකාරය ප්රදර්ශනය කර ගන්නා තෙක් අවසන් හෝරාව පැමිණෙන්නේ නැත

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "මස්ජිද්වල මිනිසුන් එකිනෙකා අලංකාරය ප්රදර්ශනය කර
ගන්නා තෙක් අවසන් හෝරාව පැමිණෙන්නේ නැත."
[صحيح] [رواه أبو داود والنسائي وابن ماجه]

මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය සමීපව ඇති බවට හා මෙලොව අවසන් වන බවට පවතින සළකුණක් නම්, මිනිසුන් මස්ජිද් තුළ ඒවායෙහි අලංකාරය හුවා දක්වමින් එකිනෙකා ආඩම්භර වීම ය. එසේ නැතහොත් මස්ජිදය තුළ අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් තොරව ඔවුන්ගේ ලෞකික කටයුතු ගැන පුරසාරම් දොඩමින් එකිනෙකා කතා කිරීම ය.

http://www.sunnah.global/hadeeth/si/show/10897